## කො/දේවි බාලිකා විද්‍යාලය

## පළමු වාර පරීක්ෂණය - 2014

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 1 1/2

**8 ශ්‍රේණිය**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. රේඵය යොදා වචන දෙකක් හා රකාරාංශය යෙදූ වචන දෙකක් ලියන්න.

02. ගයනුකිත්ත, යංශය යෙදෙන වචන දෙක බැගින් ලියන්න.

03. රෑණ , වීර , නැව , යන පදවල යෙදෙන පිල්ලම් පිළිවලට ලියන්න.

04. අල්පප්‍රාණ අක්ෂර තුනක් ලියන්න.

05. ඉහත ලියූ අල්පප්‍රාණ අක්ෂර තුනට අයත් මහප්‍රාණ අක්ෂර තුන පිළිවෙළට ලියන්න.

06. මේසය, පුටුව, හැන්ද යන පද අයත් නාම වර්ගය කුමක්ද ?

07. 'වත' යන පදයට අර්ථ දෙකක් ලියන්න.

08. පද දෙකෙහි අර්ථය පැහැදිලි ව ප්‍රකාශ නොවන යුගල පදයක් ලියන්න.

09. පහත වාක්‍යට විරාම ලක්ෂණ යොදන්න.
මම කෙසේ හෝ සෙල්ලම් කිරීමට යමියි මල්ලී කීවේය.

10. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.
සාර්ථක , විරුද්ද , ප්‍රවීන , දීර්ගායු

11. පහත වචන දෙක යොදා තනි වාක්‍යයක් ලියන්න.
ලද , ළඳ

12. සමාන පද ලියන්න.
ගගන -
ගජ -

13. විරුද්ද පද ලියන්න.
විවෘත -
සම්මාන -

14. තනි පදයක් ලියන්න.
ආහාර ඉතා හිඟ වූ කාලය.

15. පිරුළ සම්පූර්ණ කරන්න.
අලියන කපොලු තිබිය දී ............

* පහත වාක්‍ය වල හිස්තැන් පුරවන්න.

16. ඇතැම් රියදුරෝ වේගයෙන් රිය ..........

17. ඔහු වේගයෙන් පන්දුවට පහර ..........

18. ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ගී ගයමින් නටමින් විනෝද ..............

19. විදුහල්පතිතුමා සිසුන් අමතා කතා ...................

20. අම්මාත් නංගීත් මා සමඟ පෙරහැර බැලීමට .................

(ලකුණු 20)

## 2 - කොටස

* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01) "අම්මේ ඕක නවත්තලා නිදා ගන්නැද්ද ?"

1. මේ ප්‍රකාශය කළේ කවුද ?
2. ප්‍රකාශ කළේ කාටද ?
3. මේ පාඨය උපුටාගත් පාඩම කුමක්ද ?
4. පාඩම අයත් මුල් ග්‍රන්ථය කුමක්ද ?

(02) "මා පැවසුවේ සතුන්ට නැති භාෂා ශක්‍යතාවක් මිනිසාට ඇති බවයි."

1. මෙය ප්‍රකාශ කළේ කවුද ?
2. ප්‍රකාශ කළේ කාටද ?
3. මේ පාඨය උපුටාගත් පාඩම කුමක්ද ?
4. මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන සතුන් තුළ නොමැති හැකියාව කුමක්ද ?

(03) "මම දන්නේ නැහැ ඔහේගේ වයස"

1. මෙය ප්‍රකාශ කළේ කවුද ?
2. මෙම පාඨය අයත් පාඩම කුමක්ද ?
3. මෙය කුමන නිර්මාණයකින් උපුටාගත්තේද ?
4. මේ නිර්මාණය කාගේද ?

(04) "ඔබ කීවාවගේ ම ළමා සාහිත්‍ය නිර්මාණය කිරීම අපහසු කාර්යයක්"

1. මෙහි සඳහන් ළමා සාහිත්‍ය නිර්මාණයේ පුරෝගාමී වූ පුද්ගලයා කවුද ?
2. ඔහු විසින් නිර්මාණය කරන ලද ළමා සාහිත්‍ය පොත් මොනවාද ?

3. ඉහත ප්‍රකාශය කළේ කවුද ?

4. මෙම පාඨය අයත් පාඩම කුමක්ද ?

(05) "ඔන්න කොලුපැටියෝ උඹෙත් වාසනාව"

1. මෙය ප්‍රකාශ කළේ කවුද ?

2. එය අයත් පාඩම කුමක්ද ?

3. පහත වචන වල තේරුම ලියන්න.

i. පතුවළ -
ii. කරු හවුල -

(ලකුණු 20)

(06) පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

මහ හඬ දී දී වස්දඬු තාලයට හඬා
කඳුරැලි වලින් ඇද හැලෙමින් නදිය විඩා
වන දෙව්ලියන්ගේ ගම්මානයක කුඩා
කැරකෙමි සිනා රැලි මතුකොට ඉවුරු කඩා

හ

සිරිමල් සිනා රැළි පෙණ පිඩු මිහිරි තම
ගල්පර වලට හැපි හැපි බිහි කරමි මම
සම තැනිතලාවල මතුවෙයි අලස කම
නිරසයි අතර මඟ අවහිර නොදුටු බිම

1. මෙම කවි පෙළෙන් කියවෙන්නේ කුමක් ගැනද ?

2. මෙම පද්‍ය පන්තියේ සඳහන් රූපකයක් ලියන්න.

3. මෙහි දැක්වෙන මිශ්‍ර ක්‍රියා පද දෙකක් උපුටා දක්වන්න.

4. අලසකම මතුවෙන්නේ කුමන තැන්වලද 2

5. "නිරසයි අතරමඟ අවහිර නොදුටු බිම" යන පැදි පෙළෙහි අර්ථය ලියන්න.

(ලකුණු 10)

6